# ස්වයං නිර්ණය දෙමළ ජනතාව උප්පත්තියෙන් ලද උරුමයක්..
## - ආර්. සම්බන්ධන්

"........දෙමළ ජනතාව ගැන කථා කිරීමේදී ඔවුනට නිශ්චිත භාෂාවක් තිබෙනවා. ඔවුන් පිළිගන්නා වූ ආගමික තත්ත්වයක් තිබෙනවා. සංස්කෘතියක් තිබෙනවා. පරම්පරාවෙන් පරම්පරාවට විශේෂයෙන්ම උතුරු නැගෙනහිර පළාත්වල ජීවත් වෙනවා. මෙන්න මේ කාරණා නිසා දමිළ ජනතාවට ජාතියක් හැටියට සියළුම සුදුසුකම් තිබෙනවා. ඒ නිසා දමිළ ජනතාවට නිශ්චිත වූ අනන්‍යතාවයකුත් තිබෙනවා. එවැනි ජනතාවකට යම් මූලික අයිතීන් රාශියකුත් තබෙනවා. ඒ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කරන්න, නැත්නම් පිළිගන්නේ නැතිව අත්හරින්න අයිතියක් හෝ ඉඩ කඩක් නෑ. ඒ දෙමළ ජනතාව උපතින්ම ලබා ගත් උරුමයක්......."

යි දෙමළ විමුක්ති සංධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. සම්බන්ධන් ප්‍රකාශ කළේය. ඔහු එසේ ප්‍රකාශ කළේ පසුගියදා ඔස්වින් කම්කරු පාසල විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක ප්‍රධාන දෙසුම කරමිනි.

වැඩි දුරටත් අදහස් දක්වූ හෙතෙමේ,

"....යම් ජනතාවක් තමන් සංඛ්‍යාවෙන් වැඩි නිසා සංඛ්‍යාවෙන් අඩු ජාතියකට තිබෙන්නා වූ අයිතිය ඒ අයට නැහැ යි කියල සංඛ්‍යාත්මකව වැඩි ජාතියට ඒවා ප්‍රතික්ෂේප කිරීමට අයිතියක් හෝ පුළුවන් කමක් නැහැ. ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පලාත් ගැන කල්පනා කිරීමේදී සියවස් ගණනාවක් බහුතරයක් හැටියට දෙමල ජනතාව එහි ජීවත් වී තිබෙනවා. ඒ නිසා ඓතිහාසිකව මේ ආකාරයෙන් ජාතියක් හැටියට සපුරාලිය යුතු ඒ සුදුසුකම් සපුරා ඇති නිසා එවැනි ඓතිහාසික අඛණ්ඩතාවයක් ඇති ජාතියක් හැටියට ස්වයංතීරණ ගැනීමට අයිතියක් අනිවාර්යයෙන්ම පවතින බව කිව යුතුයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්ති මගින්, ප්‍රකාශන මගින් මේ මූලික අයිතිය පිළිගෙන ඇත. දැන් අපේ ස්වයංතීරණ අයිතිය දිගින් දිගටම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒ හේතුව පදනම් කරගෙන එයට විකල්ප මාර්ග අපට නැත්තේ නොවේ. විශේෂයෙන්ම මම කලින් සඳහන් කළා, 1956 සිට දිගින් දිගටම උතුර නැගෙනහිර පලාත්වල ජානතාව දෙමළ ෆෙඩරල් පාලනයක් යන අදහස මුල් කරගෙන පෙනී සිට තිබෙනවා. දෙමළ ජනතාවගේ අභිලාෂය ෆෙඩරල් පාලනයක් යටතේ ජීවත් වීමට නම් එය ප්‍රතික්ෂේප කිරීමට, නැත්නම් පිළිගන්නේ නැහැ කියල කියන්නට වෙනත් කිසිවෙකුටවත් අයිතියක් නැහැ. විශේෂයෙන් දෙමළ ජනතාව තමන්ගේ ගැටලුව විසඳා ගැනීමට ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයක් යෝජනා කළා පමණක් නොවෙයි. මේ ජාතික ගැටළුව විසඳීම සඳහා විවිධ අවස්ථාවලදී නිරන්තරයෙන් තමන්ගේ අභිලාෂයන්, අදහස් ප්‍රකාශ කර ඇත්තේය. දෙමල ජනතාවගේ ඉතිහාසයේ ඔවුන් දිගින් දිගටම ප්‍රචණ්ඩත්වයට ගිහින් නැහැ. ඒ අය ඇත්තටම අවස්ථා කිහිපයකදීම ප්‍රචණ්ඩත්වයට නැත්නම් මැරවරකම් වලට මුහුණ දුන්නා........"

යනුවෙන්ද අවධාරණය කළේය,